අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරී/ සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරී / සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුව, එම නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2026 ජූනි** මස කොළඹදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our service" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 ...මාර්තු... මස ....10....** වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර **2026 ...අප්‍රේල්... මස .....10.....** වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතුය.

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා ගණකාධිකාරී සේවයේ, පළාත් පාලන සේවයේ හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ විභාගය සඳහා සහකාර අධිකාරීවරුන් පෙනී සිටිය යුතු වේ. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන ඩී8/21/90/බ.පරි/සහකාර අධිකාරී හා 2006/01/17 දිනැති බඳවා ගැනීම් පරිපාටියෙහි දැක්වෙන අතර අයදුම්කරුවන්ගේ පහසුව සඳහා විභාග පරිපාටිය (වගුව 01) හා විෂය නිර්දේශය (වගුව 02) පහත දක්වා ඇත.

(අ) (වගුව 01) - විභාග පරිපාටිය.

| විෂය අංකය | විෂයය | කාලය (පැය) | මුළු ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු |
|---|---|---|---|---|
| 01. | නීතිය I | 03 | 100 | 40% |
| 02. | ගිණුම් ක්‍රම | 03 | 100 | 40% |
| 03. | පරිපාලන විෂය | 03 | 100 | 40% |

(ආ) (වගුව 02 ) - විෂය නිර්දේශය.

| විෂය අංකය | විෂයය | විෂය නිර්දේශය |
|---|---|---|
| 01. | නීතිය I | i. සාක්ෂි ආඥා පනත<br>ii. අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි පරිච්ඡේදයන්I,IV,V,VI,VIII,X,XII,XIV,XV,XVI,XVIII,XX,XXIV,XXV,XXVI,XXVII,XXX,XXXI හා XXXIV |
| 02. | ගිණුම් ක්‍රම | මුදල් රෙගුලාසි පරිච්ඡේද 01,02,03,04,05 හා 08 වලින් ප්‍රශ්න |
| 03 | පරිපාලන විෂය | ආයතන සංග්‍රහයේ පරිච්ඡේද I,II,V වෙනුවට කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ අදාළ පරිච්ඡේදයන් හා ආයතන සංග්‍රහයේ VI, VII,IX,XXIII,XXV,XXVI,XXVIII,XXIX,XXX,XXXI,XXXII,XXXIII,XLVII හා XLVIII |

CamScanner

සටහන.

- මගේ අංකය : PSC/APP/4/99/2018 හා 2019/01/29 දිනැති ලිපිය මගින් 2007/07/01 දිනට පසුව සහකාර බන්ධනාගාර අධිකාරී තනතුරට පත්වූ නිලධාරීන්, ඔවුන් සමත්විය යුතු පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ නුහුරු භාෂාව (දෙමළ භාෂාව) විෂයයෙන් සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇත.
- බාහිර බඳවා ගැනීම යටතේ සහකාර බන්ධනාගාර අධිකාරී තනතුරට කෙළින්ම බඳවා ගන්නා අය කඩඉම් පරීක්ෂණයේ සියලු විෂයයන් සඳහා පෙනී සිට ඉන් සමත් විය යුතුය. එසේ වුවත් නීති උපාධියක් ලබා ඇත්නම් නීතිය I නිදහස් කරනු ඇත.
- අභ්‍යන්තර උසස්වීම් මගින් සහකාර බන්ධනාගාර අධිකාරී තනතුරට පත්වන නිලධාරීන් තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ නීතිය II විෂයයෙන් හා නුහුරු භාෂාව යන විෂයයන් දෙකෙන් නිදහස් කරනු ඇත. නීතිය I, පරිපාලන හා ගිණුම් විෂයයට පෙනී සිටිය යුතුය.
- එසේ වුවත් ඔවුන් නීති උපාධියක් ලබා ඇත්නම් නීතිය I විෂයයෙන් නිදහස් කරනු ලැබේ. එසේ වූ විට ගිණුම් සහ පරිපාලන යන විෂයයන් සඳහා පමණක් පෙනී සිටිය යුතුය.

03. විභාගයේ භාෂා මාධ්‍යය : සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත ලබා දෙනු ඇත. විභාග අපේක්ෂකයන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

04. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ඉල්ලුම් පත්‍ර 2026.04.10 වැනි දිනට හෝ ඊට ප්‍රථම " විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" ලිපිනයට ලැබෙන පරිදි බන්ධනාගාර කොමසාරිස් ජනරාල් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත/විභාග

CS CamScanner

ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම සලකා බලනු නොලැබේ.

07.

i. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය.

ii. පහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

iii. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

iv. විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු වේ.

08. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

09. විභාග ගාස්තුව එක් විෂයක් සඳහා රු.250/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(ඈ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවට අයදුම්කිරීමේදී ගාස්තු අය කරනු නොලැබේ.

10. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ . එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

CS CamScanner

11. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතිනම් එහිදී සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය බලාත්මක වේ.

12. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
2026. 03.
බන්ධනාගාර මූලස්ථානයේදී ය.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

CamScanner